සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	6 ශ්‍රේණිය	කතෝලික ධර්මය I -II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

I කොටස

* **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

01. ගැලවීමේ ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුළත් පුස්තකාලයක් වැනි ශුද්ධ වූ බයිබලය තුළ අඩංගු පොත් ගණන වන්නේ?

1. 46 2. 73 3. 63 4.66

02. දිවැස් වැකි වැඩි ප්‍රමාණයක් ඇතුළත් කර ලියා ඇති ශුභාරංචි ග්‍රන්ථය වන්නේ?

1. නික්මයාම පොත 2. රූත් කථාව 3. මතෙව් ශුභාරංචිය 4. ලූක් ශුභාරංචිය

03. නික්මයාම පොතේ ඇතුළත් කරුණක් නොවන්නේ?

1. පාරාවෝ රජතුමා ඉශ්‍රායෙල් ජනයාට හිරිහැර කිරීම
2. ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට යාම
3. සීනායි කන්දේ දස පනත ලබා දීම
4. නෝවා සහ ජල ගැල්ම

04. දෙවියන් වහන්සේ සතර වන දවසේදී මැවූ මැවිලි වන්නේ,

1. ගොඩබිම,ජලය 2. ආලෝකය 3. ඉර,හඳ, තාරකා 4. පක්ෂීන්

05. ජේසුතුමන් උපන් නගරය වන්නේ,

1. ජෙරුසලම 2. බෙත්ලෙහෙම 3. ඊජිප්තුව 4. රෝමය

06. ළමා වියේ සිට ජේසුස් වහන්සේ වැඩුණු ආකාරයක් නොවන්නේ,

1. ප්‍රඥා මහිමයෙන් 2. කාය ශක්තියෙන් 3. දෙවිදුන්ගේ ප්‍රසාදයෙන් 4. කීර්තිනාමයෙන්

07. සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධානයක් වන්නේ,

1. අභිවෘද්ධි ආලේපනය 2. පාපොච්චාරණය 3. පූජකවරය 4. රෝගීන්ගේ ආලේපය

Past Papers Wiki

08. තමාගේ මෙන්ම අන් අයගේ ජීවිත සුරැකීමට අපට ආරාධනා කරන්නේ කුමන පනතින්ද?

1. 5 වන පනත 2. 6වන පනත 3. 7වන පනත 4. 4වන පනත

09. නිවැරදි ලෙස සියල්ල තේරුම් ගැනීමට ශක්තිය අය දින යාච්ඤාව කුමක්ද?

1. උදය ආරාධනාව
2. භෝජන ආශීර්වාදය
3. රාත්‍රී ආරාධනාව
4. ස්ප්‍රීතු සාන්තු වහන්සේට යාච්ඤාව

10. ස්වාමීවාක් ආරාධනාවේ ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ?

1. ඉල්ලීම 2. ගායනය 3. දේව ප්‍රශංසාව 4. සමාව අයදීම

*** අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

11. සිංහයාගෙන් සංකේතවත් කරන්නේ.....සුබ ආරංචියයි.
12. දෙවියන් වහන්සේ පොළවේ දුවිල්ලෙන්.....මවා වදාළ සේක.
13. ජේසුස් වහන්සේගේදෙමව්පියෝ .....සැමරීම සඳහා ජෙරුසලමට ගියහ.
14. පාස්කු අභිරහස යනු ක්‍රිස්තුස් වහන්සේගේ.....
.....මරණය හා උත්ථානයයි.
15. ඔබට පීඩා කරන්නන් උදෙසා .....කරන්න.

(දුක්විඳීම, මාක්, පාස්කු උළෙල, මනුෂ්‍යයා, යාච්ඤා)

*** අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

16. දෙවියන් වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණෝය. ( )
17. ජුසේතුමා අගෝස්තුස් අධිරාජ්‍යාගේ පෙළපතට අයත් ය. ( )
18. අගෝස්තු 15 මරියාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍යයයි. ( )
19. සභාවේ නඩත්තුව සඳහා ආධාර දීම ශික්ෂා පදයකි. ( )
20. ස්වර්ගයේ වැඩසිටිනයාකඳාව උදය ආරාධනය ලෙස හඳුන්වයි. ( )

Past Papers Wiki

II කොටස

* **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) I. පංච පුස්තකයට අයත් පොත් 2ක් නම් කරන්න.
II. මෙසියස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ බව පෙන්වා දී ඇත්තේ කුමන ශුභාරංචියේද?
III. ලෝකය මැවීමේදී දෙවිදුන් තුන්වන දින මැවූ මැවිලි 2ක් ලියන්න.
IV. දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ 2ක් ලියන්න.
V. ගොඩමස් වැළකීම සඳහා නියමවූ දින දෙකක් ලියන්න.
VI. යාච්ඤාව පිළිබඳ උපමා 2ක් නම් කරන්න.
VII. නිතර භාවිතා වන පොදු යැදුම් 2ක් ලියන්න.
VIII. දේව මාතාවන් දර්ශනය වූ ස්ථාන 2ක් ලියන්න.
IX. පැරණි ගිවිසුමේ සඳහන් යාච්ඤා පොත කුමක්ද?
X. ඔබේ දෙමාපියන්ට ගෞරව කළ හැකි ආකාර 2ක් ලියන්න. *(ලකුණු 2x10=20)*

(02) I. පංච පුස්තකය සඳහා යෙදෙන වෙනත් නම් දෙකක් ලියන්න.
II. ශුද්ධ වූ ජොහාන් තුමා පිළිබඳ කරුණු තුනක් ලියන්න.
III. කිතුනු දරුවෙකු ලෙස දේව ආදරය අන් අය සමඟ බෙදා බෙදාගන්නා ආකාර පහක් ලියන්න.
(ලකුණු 2+3+5=10)

(03) I. මිනිසා අන් මැවිලි වලට වඩා උසස් වීමට හේතු දෙකක් ලියන්න.
II. දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට භාරදී ඔහු වෙත පැවරූ වගකීම් තුනක් ලියන්න.
III. දේව මැවිල්ල සංරක්ෂණය කිරීමට ඔබට දායක විය හැකි ආකාර පහක් ලියන්න.
(ලකුණු 2+3+5=10)

(04) I. ජුදා ජාතිකයන්ගේ ආගමික හා ජාතික චාරිත්‍ර දෙකක් ලියන්න.
II. ශුද්ධවූවූලූක් තුමා දක්වන පරිදි ළමා ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න.
III. ඔබව මෙලොවට බිහිකර ඇති දැඩි කළ දෙමාපියන් වෙනුවෙන් කළ හැකි යුතුකම් පහක් ලියා දක්වන්න.
(ලකුණු 2+3+5=10)

(05) I. ප්‍රසාද ස්ථාපනයේ දී භාවිතා වන සංකේත දෙකක් ලියන්න.
II. එක් වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධාන තුන ලියන්න.
III. සමගි සන්ධානය නම් වූ දේව ප්‍රසාද නිධානය ලැබීමෙන් අත්වන වරප්‍රසාද පහක් ලියන්න.
(ලකුණු 2+3+5=10)

(06) I. යාච්ඤාව යනු කුමක්දැයි අර්ථ දක්වන්න.
II. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා තුනක් ලියන්න.
III. රෝගාතුර වී රෝහල්ගතව සිටින ඔබේ මිතුරෙකුට අවශ්‍ය සුවය පතා දෙවිපියාණන්ට කරන යැදුමක් ලියා දක්වන්න.
(ලකුණු 2+3+5=10)

(07) I. අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයෙහි ඇති සත්‍යතාවයන් දෙකක් ලියන්න.
II. ගීතාවලියෙහි ඇතුළත් වන යාච්ඤා වර්ග තුනක් ලියන්න.
III. දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී වීමට ඔබට කළ හැකි දේවල් පහක් ලියා දක්වන්න.
(ලකුණු 2+3+5=10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank